Vidyodaya Journal of Humanities and Social Sciences

VJHSS (2023), Vol. 08 (01)

# Design Basis of Decorative Motifs Used in Sri Lankan Weapon Designing During the Kandyan Period

D. A. L. J. Dharmawardana

Department of Textile and Wearable Arts, University of Visual and Performing Arts, Sri Lanka

**Article Info**

Article History:
Received 12 Sep 2022
Accepted 14 Oct 2022
Issue Published Online
01 January 2023

**Key Words:**
Weapon Designing
Applied Arts
Decorative Motifs
Concept
Inspiration

*Corresponding author
E-mail address:
asantha.d@vpa.ac.lk

https://orcid.org/ 0000-0003-3903-3339

Journal homepage:
http://journals.sjp.ac.lk/index.php/vjhss

http://doi.org/10.31357/fhss/vjhss.v08i01.13

VJHSS (2023), Vol. 08 (01), pp. 228-246

ISSN 1391-1937/ISSN 2651-0367 (Online)

Faculty of Humanities and Social Sciences 2023

## ABSTRACT

*Design basis of decorative motifs used in Sri Lankan weapon designing in Kandyan period has been studied by this research. This study focused on investigating the strategic usage of decorative motifs to fulfill the designing requirements in the production process of weapons as an applied art product in Kandyan period. Accordingly, the objective of this research was to study the technical approach of the use of traditional artistic motifs for fulfilling the designing requirements. While the study followed a qualitative research approach, Museum studies, field studies, photography, drawings and illustrations have been used to collect the data for this research. Accordingly, all the locally manufactured traditional weapons and firearms displaying in Sri Lankan museums that have identified as belongings to Kandyan period have been used as study sample of this research. Iconology and formalism have been used as methodologies to analyze data and the grounded theory of this research was Sven Ove Hanson's aesthetic functionalism theory. Above mix methodology was useful to investigate the meanings of traditional motifs as well as visual and structural analysis of the data. In conclusion, decorative motifs used in Sri Lankan weapons in Kandyan period can be identified as a design factor more than artistic application and those decorative motifs have been used as strategic applications such as concept, inspiration, and create visual form as well as structural requirements for the weapons.*

**මාතෘකාව**
මහනුවර යුගයේ ශ්‍රී ලාංකේය ආයුධ නිර්මාණකරණයේ දී භාවිත සැරසිලි මෝස්තර ආශ්‍රිත සැලසුම්කරණ පදනම

## 1. හැඳින්වීම

### 1.1 පර්යේෂණ පසුබිම

මහනුවර යුගයේ ශ්‍රී ලාංකේය ආයුධ ආශ්‍රිතව සැරසිලිකරණය ප්‍රමුඛ සාධකයක් වශයෙන් නිරීක්ෂණය කළ හැකිය. මූලික වශයෙන්ම සැරසිලි මූලයන්හි පරමාර්ථය වන්නේ අලංකරණය හෝ ආකර්ෂණය උද්දීපනය කිරීමයි. එහෙත් ආයුධවල හිංසාකාරී පදනම හා විෂම භාවිතයක් වන සැරසිලි මෝස්තර භාවිත ආයුධ නිෂ්පාදනයේ දී අදාළ කරගෙන ඇති ආකාරය පිළිබඳව මෙමගින් අධ්‍යයනය කර තිබේ. ආයුධ ආශ්‍රිතව සැරසිලි මෝස්තර ස්ථානගත කර තිබුණ ද ඒවාට ලලිත කලා කෘතියක මෙන් ස්වාධීන භාවයක් නොමැත. ඊට හේතුව වන්නේ ව්‍යවහාරික කලාකෘතියක දී කලාව පවතින්නේ මූලික උපයෝගිතාවට සමගාමීව වන බැවිනි (Hanson, 2005). ඒ අනුව මෙම අධ්‍යයනය ආයුධ නිර්මාණකරණයේ දී සැරසිලි ආශ්‍රිත සැලසුම්කරණ ලක්ෂණ පිළිබඳව සිදු කර තිබේ. මහනුවර යුගයේ කලාව හා සැරසිලිකරණය පිළිබඳව දේශීය හා විදේශීය වශයෙන් සිදු කරන ලද අධ්‍යයනයන් දැකිය හැකි වුව ද ව්‍යවහාරික කලා නිර්මාණ සඳහා සැරසිලි යොදා ගැනීමේ සැලසුම්කරණ පදනම පිළිබඳ අධ්‍යයනයන් දක්නට නොලැබේ. එහෙත් මහනුවර යුගයේ දේශීය ව්‍යවහාරික කලාව පිළිබඳව තොරතුරු ඉදිරිපත් කර ඇති *වෛජයන්ත තන්ත්‍රය* (මුදියන්සේ, 1983), සෙනෙවිරත්න විසින් අනුවාදිත *චතුෂෂ්ෂ්ට් කලා* (1967), ජෝන් ඩේවිගේ *An Account of the Interior of Ceylon, and of its Inhabitants. With Travels in that Island* (1821), ආනන්ද කුමාරස්වාමිගේ *Mediaeval Sinhalese Art* (2012) කෘතිය මෙන් ම කුමාරස්වාමිගේ *Arts and crafts in India and Ceylon* (1913) කෘතිය වැනි කෘති ආශ්‍රිතව දේශීය ව්‍යවහාරික කලාව පිළිබඳ තොරතුරු ද ඉදිරිපත් කර තිබේ. එහෙත් ඍජුවම ආයුධ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත්තේ අල්පවය. එමෙන්ම පී. එච්. ඩී. එච්. ද සිල්වා සහ එස්. වික්‍රමසිංහගේ *Ancient Swords, Daggers and Knives in Sri Lankan Museums* (2007) කෘතිය ද මහනුවර යුගයේ දේශීය ආයුධ පිළිබඳ ලිය වී ඇති කෘතියකි. එහෙත් උක්ත කෘති මගින් දේශීය ආයුධවල සැරසිලිකරණය හෝ සැලසුම්කරණය පිළිබඳ පුළුල් ගවේෂණයක් දැකිය නොහැකි ය. ඒ අනුව ආයුධ නිෂ්පාදනයේ දී දී භාවිත සැරසිලි මෝස්තර, ව්‍යවහාරික නිර්මාණයක් වශයෙන් ආයුධ සැලසුම්කරණය කෙරෙහි බලපා ඇති ආකාරය මෙමගින් විමර්ශනයට ලක් කර ඇත. දැරණියගලගේ *Sinhala Weapons and Armor* (1942) කෘතිය දේශීය ආයුධ පිළිබඳ හා ඒවායේ දෘශ්‍ය ලක්ෂණ මෙන්ම භාවිතය පිළිබඳ වැදගත් තොරතුරු ඉදිරිපත් කර තිබේ. ඒ අනුව උක්ත සාහිත්‍ය මෙම අධ්‍යයනයේ පසුබිම නිර්මාණය කර ගැනීම සඳහා වැදගත් විය. එහෙත් ආයුධ සැරසිලිකරණය පිළිබඳව ගෝලීය සාහිත්‍ය ආශ්‍රිතව දේශීය සාහිත්‍යට වඩා පුළුල් සංවාදයක් දැකිය හැකිය. ෂෝවර්ගේ (2016) තර්කයට අනුව ආයුධවලට සැරසිලි එක්වීමත් සමග ආයුධය සමාජීය භාවිතයක් බවට පත් වේ. එමෙන් ම සෞන්දර්යාත්මක මූලයන් එකතු වීමත් සමග කඩුව සංස්කෘතික භාවිතයක් බවට පත් වීම පිළිබඳ ව එත්‍රිගේ (2007) අනාවරණය කර තිබේ. බැරන් පවසන්නේ ද (2010) ආයුධ වෙත කලාව එකතු වීම තත්කාලීන සමාජ දර්ශකයක් වශයෙන් වැදගත් වන බවයි. එමෙන්ම බර්නින් (2013) පවසන්නේ ආයුධ වෙත සැරසිලි මූලයන් එකතු වීම මගින් ආයුධය වෙත ජීවය ආරෝපණය වන බවත් එය කඩුව හා පාරිභෝගිකයා අතර ශක්තිමත් බැඳීමක් ඇති කිරීමට ඉවහල් වූ බවයි.

උක්ත සාහිත්‍ය විමර්ශනයෙන් පැහැදිලි වන්නේ ආයුධ වෙත කලාත්මක භාවිතයන් අදාළ කර ගැනීමත් සමග ආයුධවල භාවිතය හා දෘශ්‍ය ප්‍රකාශනය විවිධාංගීකරණය වී ඇති ආකාරයයි. ගෝලීය ආයුධ නිර්මාණකරණයේ දී මෙන්ම මහනුවර යුගයේ ශ්‍රී ලාංකේය ආයුධ ආශ්‍රිතව ද කලාත්මක භාවිත ආයුධ වෙත අදාළ කරගෙන ඇති ආකාරය නිරීක්ෂණය කළ හැකි ප්‍රමුඛ සාධකයකි. කෙසේ වුවද කලාත්මක යෙදවුම් භාවිත කළ ද ආයුධය ව්‍යවහාරික උපයෝගීතාව මත සිදු කරනු ලබන නිෂ්පාදනයක් බැවින් එහි ව්‍යවහාරික පදනම මගහැරිය නොහැකිය. ඒ අනුව මහනුවර යුගයේ ශ්‍රී ලාංකේය ආයුධ නිර්මාණකරණයේ දී භාවිත සැරසිලි මෝස්තර ආශ්‍රිත සැලසුම්කරණ පදනම මෙම අධ්‍යයනය මගින් විමර්ශනය කර තිබේ.

### 1.2 පර්යේෂණ ගැටලුව හා උපන්‍යාසය

මහනුවර යුගයේ ශ්‍රී ලාංකේය ආයුධ නිෂ්පාදනය කිරීමේ දී සැරසිලිකරණ යෙදවුම් අදාළ කර ගැනීමේ සැලසුම් ශිල්පීය පදනම කෙබඳු ද? යන ගැටලුව මෙම අධ්‍යයනයට පාදක වේ. ඒ අනුව ව්‍යවහාරික නිෂ්පාදනයක් වන ආයුධ සඳහා සැරසිලි අදාළ කර ගැනීමේ දේශීය සාම්ප්‍රදායික ව්‍යවහාරික කලා ඥානය පිළිබඳව මෙමගින් අධ්‍යයනය කෙරේ. ''මහනුවර යුගයේ ආයුධ ආශ්‍රිතව නිරූපිත සැරසිලි මෝස්තර සැලසුම්කරණ සාධකයක් වශයෙන් උපායමාර්ගික භාවිතයක් වේ'' යන්න මෙම පර්යේෂණයේ උපන්‍යාසය වේ.

### 1.3 පර්යේෂණ අරමුණු

ආයුධ මූලික වශයෙන්ම ආරක්ෂක උපයෝගිතාව මත පදනම් වූ ව්‍යවහාරික භාණ්ඩයක් වුවත් ක්‍රමිකව වෙනත් අවශ්‍යතා සඳහා ද නිෂ්පාදනය වී තිබේ. මෙසේ ආයුධ විවිධාංගීකරණය වීමේ දී නිරීක්ෂණය කළ හැකි ප්‍රමුඛ ලක්ෂණයක් වන්නේ ආයුධ සඳහා සැරසිලි මෝස්තර භාවිත කිරීමයි. ඒ අනුව මහනුවර යුගයේ දේශීය ආයුධ නිර්මාණකරණයේ දී භාවිත සැරසිලි මෝස්තර ආශ්‍රිත සැලසුම්කරණ පදනම විමසීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. දේශීය

සාම්ප්‍රදායික ව්‍යවහාරික කලාව ආශ්‍රිතව භාවිත සැලසුම් ශිල්පීය ලක්ෂණ හඳුනාගැනීම ද මෙම අධ්‍යයනය මගින් අපේක්ෂිතය.

### 1.4 පර්යේෂණ සීමා

මෙම පර්යේෂණය මගින් මහනුවර යුගයේ ආයුධ සැරසිලිකරණය හා ඒ ආශ්‍රිත සැලසුම්කරණ ලක්ෂණ පිළිබඳ අධ්‍යයනය කර තිබේ. ඒ අනුව මෙම අධ්‍යයනයට පාදක වන කාල සීමාව 1592 සිට 1815 දක්වා වේ. පර්යේෂණයට භාජනය කර ඇති භාණ්ඩ ගහණය සාම්ප්‍රදායික ආයුධ අතර පංචායුධ වශයෙන් පිළිගැනෙන කඩුව, පිහාකැත්ත, දුනු හී, හෙල්ල, පොරව සහ පළිහ මෙන්ම දේශීය ව නිෂ්පාදිත ගිනි අවි යන ආයුධවලට සීමා වී තිබේ. අධ්‍යයනය සඳහා පාදක වන අධ්‍යයන නියැදිය මහනුවර යුගයේ නිෂ්පාදිත යැයි හඳුනාගෙන ඇති, දැනට දේශීය කෞතුකාගාරවල ප්‍රදර්ශනයට තබා ඇති ආයුධ අතරින් තෝරාගෙන තිබේ. ව්‍යවහාරික කලා නිෂ්පාදනයක් වශයෙන් ආයුධ තත්කාලීන සමාජ දේශපාලනික අරමුණු පදනම්කරගෙන නිර්මාණය කරන ලද උපයෝගීතා භාණ්ඩයක් වන අතර මෙම පර්යේෂණය, මහනුවර යුගයේ ශ්‍රී ලාංකේය ආයුධ නිර්මාණකරණයේ දී භාවිත සැරසිලි හා ඒවායේ සැලසුම්කරණ පදනම කෙරෙහි සීමා වේ.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනයට පාදක වන භාණ්ඩ ගහණය වන්නේ ක්‍රි. ව. 1592 සිට 1815 දක්වා කාලයට අයත් ශ්‍රී ලාංකේය ආයුධ නිර්මාණ වේ. ඒ අනුව මහනුවර යුගයට අයත් යැයි හඳුනාගෙන ඇති කොළඹ ජාතික කෞතුකාගාරය, මහනුවර ජාතික කෞතුකාගාරය, රත්නපුර ජාතික කෞතුකාගාරය, ගාල්ල ජාතික කෞතුකාගාරය, කොළඹ ඕලන්ද කෞතුකාගාරය සහ නිදහස් චතුරශ්‍ර කෞතුකාගාරය ආශ්‍රිත ව ප්‍රදර්ශනයට තබා ඇති දේශීය ආයුධ, භාණ්ඩ ගහනය යටතේ අධ්‍යයන නියැදිය වශයෙන් යොදාගෙන තිබේ. ඒ අනුව කඩුව, දුන්න, පොරොව, හෙල්ල, පළිහ සහ පිහා කැත්ත මෙන්ම සාම්ප්‍රදායික ගිනි අවි යටතේ බොණ්ඩිකුල, වඩන තුවක්කු, අත් තුවක්කු සහ ජිංගල් තුවක්කු යන ආයුධ මෙම අධ්‍යයනයට පාදක කොටගෙන තිබේ. මෙම නියැදිය තෝරා ගැනීමට හේතුව වන්නේ මහනුවර යුගයේ දී බහුලවම භාවිත කර ඇති ආයුධ ඊට අයත් වීමයි.

කෞතුකාගාර අධ්‍යයනය, ක්ෂේත්‍ර අධ්‍යයනය, පුස්තකාල අධ්‍යයනය, ඡායාරූපකරණය හා චිත්‍රණය යන විධික්‍රම මෙම පර්යේෂණයේ දී භාවිත කර තිබේ. ඊට අමතරව පර්යේෂණයට අදාළ දත්ත සපයා ගැනීමේ දී අන්තර්ජාල අධ්‍යයනය ද මූලාශ්‍රයක් වශයෙන් භාවිත කර තිබේ. ගුණාත්මක පර්යේෂණයක් වන මෙම අධ්‍යයනයේ දී මිශ්‍ර ක්‍රමවේදය භාවිත කර තිබේ. මහනුවර යුගයේ ආයුධ නිර්මාණ ආශ්‍රිත සැරසිලිකරණ මෝස්තරවල දෘශ්‍ය ලක්ෂණ අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ එක් පැතිකඩකි. ඒ අනුව ආයුධ නිර්මාණකරණයේ දී නිරීක්ෂණය කළ හැකි සැරසිලිකරණ යෙදවුම් ආශ්‍රිතව භාවිත දෘශ්‍ය මූල සහ දෘශ්‍ය ලක්ෂණ විශ්ලේෂණය කිරීමේ දී එමානුවෙල් කාන්ට්ගේ අදහස්වලින් පෝෂණය වූ කලාත්මක ආකෘතිවාදී ක්‍රමවේදය වැදගත් විය (Dziemidok, 1993). එමගින් ආයුධවල හැඩය, ස්වරූපය හා ආකෘතික ස්වභාවය කෙරෙහි සැරසිලි මෝස්තරවල ආභාසය පිළිබඳ විශ්ලේෂණය කර තිබේ. එමෙන්ම මෝස්තර භාවිතය ආශ්‍රිත සංකල්පීය හා භාවමය වටිනාකම් විශ්ලේෂණයේ දී ෆැනොෆ්ස්කිගේ රූපාර්ථවේදී ක්‍රමවේදය භාවිත කර තිබේ (Panofsky, 1972). සැලසුම්කරණයේ දී නිර්මාණයක සංකල්පීය හෝ භාවමය හා ආකෘතිකමය යන අංශ දෙකම වැදගත් වන බැවින් මෙම අධ්‍යයනය සඳහා උක්ත මිශ්‍ර ක්‍රමවේදය වඩාත් වැදගත් විය.

එමෙන්ම මෙම අධ්‍යයනයේ පදනම් න්‍යාය වශයෙන් ක්‍රියාකාරී සෞන්දර්යවාදී න්‍යාය භාවිත කර තිබේ (Hanson, 2005). යම් ව්‍යවහාරික කලා නිර්මාණයක කලාත්මක ලක්ෂණ එහි උපයෝගීතාව සහ ක්‍රියාකාරීත්වයට අනුරූපීව විනිශ්චය කිරීම ක්‍රියාකාරී සෞන්දර්ය න්‍යායේ පදනම වේ. එය මහනුවර යුගයේ ආයුධ නිර්මාණකරණයේ දී භාවිත සැරසිලිවල ව්‍යවහාරික කලා ප්‍රවේශය පිළිබඳ විමසීමේ දී අවශ්‍ය න්‍යායික උත්තේජනය ලබා දී තිබේ.

එමෙන්ම *වෛජයන්ත තන්ත්‍රයේ* (1983) දක්වා ඇති දේශීය සාම්ප්‍රදායික කලාව සහ කලා ශිල්ප පිළිබඳ සෛද්ධාන්තික සංකල්ප සහ විධානයන් මෙන්ම කුමාරස්වාමිගේ (2012) පෙරදිග කලාව පිළිබඳ න්‍යායික සහ සංකල්පීය ඉදිරිපත් කිරීම් ද මෙම අධ්‍යයනයේ පසුබිම් න්‍යාය වශයෙන් වැදගත් විය.

## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

මහනුවර යුගයේ ආයුධ ආශ්‍රිතව නිරීක්ෂණය කළ හැකි සැරසිලි පිළිබඳ අවධානය යොමු කිරීමේ දී පැහැදිලි වන්නේ බහුල වශයෙන්ම දේශීය සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර ඒ සඳහා භාවිත කර ඇති බවයි. ඒ අනුව මෙම අධ්‍යයනයට පාදක වූ නියැදිය ආශ්‍රිතව කුමාරස්වාමි (2012) විසින් ඉදිරිපත් කර ඇති ''දේව'' වර්ගයට අයත් සැරසිලි හැර ''සත්ව, වෘක්ෂ සහ ජ්‍යාමිතික'' (p. 80) යන සියලුම සැරසිලි මෝස්තර නිරීක්ෂණය කළ හැකිය.

ඒ අනුව සිංහ මෝස්තර (01, 02 රූප), මකර හා කිඹිසි මෝස්තර (01, 02 රූප), පක්ෂි මෝස්තර (01, 05, 06 රූප), නාරි මෝස්තර (06 රූපය), පුෂ්ප හා වෘක්ෂ මෝස්තර (03, 04 රූප) මෙන්ම බහුල වශයෙන් නොවුණ ද ජ්‍යාමිතික මෝස්තර (රූපය 08) ද නිරීක්ෂණය කළ හැකිය.




**රූපසටහන 1.** සිංහ සහ ගුරුළු මෝස්තරවල දෘශ්‍ය නිරූපණය. ජාතික කෞතුකාගාරය, කොළඹ.



**රූපසටහන 2.** කස්තාන කඩුවේ අල්ලුව මත කිඹිසි මෝස්තරය ස්ථානගත කර ඇති ආකාරය. ජෝර්ජ් කරවානා එකතුව. මෙක්සිකෝව



**රූපසටහන 3.** ලියවැල්, ගල් බිංදුව හා ජ්‍යාමිතික සැරසිලි සහිත හෙල්ල මිට කිහිපයක්. ජාතික කෞතුකාගාරය, රත්නපුර.




**රූපසටහන 4.** කස්තාන කඩු දෙකක් ආශ්‍රිතව පුෂ්ප සහ වෘක්ෂ මෝස්තර නිරූපණය කර ඇති ආකාරය. ජාතික කෞතුකාගාරය, කොළඹ.




**රූපසටහන 5.** ලියපත සහ ගුරුළු මෝස්තරය සහිත පිහාකැත්ත මිට දෙකක් ජාතික කෞතුකාගාරය, මහනුවර.



**රූපසටහන 6.** පිහාකැත්ත ආශ්‍රිතව ගුරුළු මෝස්තරය සහ නාරි මෝස්තරය සංරචනය කර ඇති ආකාරය. ජාතික කෞතුකාගාරය,



**රූපසටහන 7.** සියුම් සැරසිලි සහිත රාජකීය බොණ්ඩිකුල තුවක්කුවක්. ජාතික කෞතුකාගාරය, කොළඹ.





**රූපසටහන 8.** මහනුවර යුගයේ භාවිත පළිහේ ඉදිරිපස පෙනුම හා පැති පෙනුම

ඉහත දක්වා ඇති ආයුධ වර්ග ආශ්‍රිතව දේශීය සාම්ප්‍රදායික සැරසිලි ස්ථානගත කර ඇති ආකාරය හඳුනාගත හැකිය. එම ආයුධ ආශ්‍රිතව නිරීක්ෂණය කළ හැකි මූලිකවම සාධකය වන්නේ සැරසිලිකරණය සඳහා දේශීය සාම්ප්‍රදායික ශෛලිගත සැරසිලි මෝස්තර භාවිත කිරීමයි. ඒ අනුව ආයුධවල වයනය හා ස්වරූපය වැඩිදියුණු කිරීම සඳහා දේශීය ශෛලිගත සැරසිලි මූලාශ්‍රය කරගෙන ඇති බවයි.

ඒ අනුව ආයුධවල ආකෘතිය සහ දෘශ්‍ය ස්වරූපය සංවර්ධනය කිරීම සඳහා දේශීය සැරසිලි මෝස්තර භාවිතය දේශීය ආයුධ නිර්මාණ ශිල්පියාගේ වැදගත් ප්‍රවේශයකි. මෙහි දී දේශීය ශිල්පියා විසින් භාවිත උපක්‍රමය ආශ්‍රිතව සමකාලීන සැලසුම්කරණ ක්‍රියාවලියේ සංකල්ප සංවර්ධන ප්‍රවේශය (Howard, Culley, & Dekoninck, 2008) හා සමගාමී ලක්ෂණ නිරීක්ෂණය කළ හැකිය. එනම්, ආයුධ නිෂ්පාදනයේ දී නිර්මාණාත්මක හා නව්‍ය ආකෘති නිර්මාණය කර ගැනීම සඳහා ආවේශය වශයෙන් දේශීය ශෛලිගත සැරසිලි මෝස්තර සහ සංකල්ප භාවිතය යි. සමකාලීන සංකල්ප සංවර්ධන න්‍යාය අශ්‍රිතව සංකල්පය හා ආවේශය වශයෙන් ප්‍රධාන සාධක දෙකක් නිරීක්ෂණය කළ හැකිය. නව සැලසුමක් නිර්මාණය වීම කෙරෙහි මෙම සාධක නිරන්තරයෙන් පාදක වන බව සමකාලීන සැලසුම් ක්ෂේත්‍රයේ පිළිගැනීම වේ (Cardoso & Badke, 2011). ඒ අනුව ආවේශය ආයුධ සැරසිලිකරණය ආශ්‍රිත දෘශ්‍ය සංකල්පය වන අතර එම දෘශ්‍ය සංකල්ප යොදාගැනීමට පදනම් වූ භාවය පදගත සංකල්පය වශයෙන් හැඳින්විය හැකි ය. හැමවිට ම දෘශ්‍ය සංකල්පය ඊට මුල් වූ පදගත සංකල්ප මත පදනම්ව තිබේ. ඒ අනුව දේශීය ආයුධ නිර්මාණකරණයේ දී පදගත සංකල්පය හා දෘශ්‍ය සංකල්පය යන සාධක භාවිත කර ඇති ආකාරය පිළිබඳව මෙහි දී අවධානය යොමු කර තිබේ.

මෙම ප්‍රවේශයේ දී සැරසිලි මෝස්තරය මගින් සිදු කරනු ලබන භාවමය ප්‍රකාශනය කෙරෙහි ආයුධය මගින් ඇති කරනු ලබන සංකේතාර්ථය, සැරසිලි මෝස්තර නිරූපණය සහ එවායේ පරිමාණ ලක්ෂණ වැදගත් වේ. එනම්, සැරසිලිකරණය සඳහා භාවිත ආයුධය සමාජය තුළ අත්කරගෙන ඇති ආස්ථානය සහ එහි ආකෘතිය ආශ්‍රිතව අදාළ මෝස්තරය කෙතරම් ඉස්මතු වන්නේ ද යන සාධකයි. එහි දී අවශේෂ සැරසිලිවල බලපෑම ද මග හැරිය නො හැකි ය. ඒ අනුව සැරසිලි මෝස්තරයේ සංකේතාර්ථ මෙන් ම එය ස්ථානගත කිරීම ආශ්‍රිත දෘශ්‍ය ලක්ෂණ සහ අවකාශය ද පරමාර්ථ සාධනයේ දී වැදගත් වී තිබේ. පහත අංක 09 චිත්‍ර සටහන මගින් මහනුවර යුගයේ කස්තාන කඩුවේ මිට ආශ්‍රිතව නිර්මාණකරණයේ දී සැරසිලි මෝස්තර අදාළ කරගෙන ඇති ආකාරය සහ ඒවායේ පරිමාණයන්හි විවිධත්වය ඊට උදාහරණයකි.





**රූපසටහන 9.** කස්තාන කඩුව ආශ්‍රිතව A සිංහ B ගුරුළු C මකර මෝස්තර ස්ථානගත කර ඇති ආකාරය (මහනුවර ජාතික කෞතුකාගාරයේ තැන්පත් කර ඇති කඩුවක් ඇසුරින් කරන ලද චිත්‍ර සටහනකි )

යම් කිසි භාණ්ඩයක යම් සංකල්පයක් දෘශ්‍යමය වශයෙන් ස්ථානගත කිරීම මගින් ගම්‍ය වන අර්ථ නිරූපණය මෙහි දී සැලකිය යුතු සාධකයකි. ඒ අනුව කඩුවේ ඉහළ ම ස්ථානය සිංහ සංකල්පය මගින් ප්‍රධාන නාභීය ලක්ෂ්‍ය බවට පත් කිරීමෙන් ප්‍රකට වන්නේ කස්තානයේ දෘශ්‍ය ප්‍රකාශනය සිංහ සංකල්පය මත පදනම් වී ඇති බවයි. කස්තාන කඩුව සඳහා සිංහ සංකල්පය භාවිතයේ දෘශ්‍යමය ප්‍රවේශය පිළිබඳව සහ සිංහ සංකල්පය ආරක්ෂාව හා ගෞරවයේ සංකේතයක් වශයෙන් භාවිත වී තිබේ (සිල්වා, 2009). ඒ අනුව කඩුව සහ සිංහයා අතර ආරක්ෂාව පිළිබඳ සංකල්පීය වශයෙන් සබඳතාවක් ඇති බව පැහැදිලි වේ. කඩුව භාවිතය මගින් ස්ථාපිත කරන ලද ආරක්ෂාව පිළිබඳ සංකල්පීය අදහස සිංහයා යොදා ගනිමින් දෘශ්‍යමාන කිරීම සම්භාව්‍ය සැලසුම්කරණ භාවිතයක් වශයෙන් හැඳින්විය හැකි ය. එහි දී ආරක්ෂාව සහ ගෞරවණීයත්වය ආයුධය නිර්මාණයට පදනම් වූ පදගත සංකල්පය වී ඇති අතර එය ආයුධය මගින් ප්‍රකාශ කිරීම සඳහා දෘශ්‍ය සංකල්පය හෙවත් ආවේශය වශයෙන් සිංහ මෝස්තරය භාවිත කර තිබේ. ජන විඥානය තුළ සිංහයා පිළිබඳව පැවති ආරක්ෂාව පිළිබඳ සංජානනය ඊට හේතු වී තිබේ. සිංහයා යොදා ගැනීමේ දී පදගත අර්ථය වඩාත් හොඳින් ඉස්මතු කළ හැකි අයුරින් භාවිත කර තිබීම වැදගත් ලක්ෂණයකි. එනම්, සිංහ ගර්ජනය දෘශ්‍යමය ආකාරයෙන් ඉදිරිපත් කිරීමයි (10 රූපය බලන්න).



**රූපසටහන 10.** සිංහ ගර්ජනාව සහ කස්තාන කඩුවේ දැක්වෙන සිංහ සංකල්පයේ දෘශ්‍ය රූපය.
(මහනුවර ජාතික කෞතුකාගාරයේ තැන්පත් කර ඇති කස්තාන කඩුවක් ඇසුරින් සංස්කරණය කරන ලද ඡායාරූපයකි)



**රූපසටහන 11** යුධ කඩුව සහ කස්තාන කඩුවේ ආකෘතික ලක්ෂණ
(දේශීය යුධ කඩුවක දෘශ්‍ය ස්වරූපය සහ කොළඹ ජාතික කෞතුකාගාරයේ තැන්පත් කර ඇති කස්තාන කඩුවක් ඇසුරින් කරන ලද චිත්‍ර සටහනකි)

මෙරට දී දැකිය නො හැකි සත්ත්වයකු යොදා ගැනීම මගින් සන්නිවේදනය නියමාකාරයෙන් සිදු කිරීමේ හැකියාව පිළිබඳව ද මෙහි දී අවධානය යොමු කළ යුතු ය. එහෙත් ශිල්පියා මෙහි දී අවධානය යොමු කර ඇත්තේ සැබෑ සිංහයා හා ජනයා අතර අත්දැකීමට වඩා සිංහයා පිළිබඳ සංකල්පීය වශයෙන් පොදු ජන විඥානය තුළ වූ අදහස සිංහයා මගින් සන්නිවේදනය කිරීම බව පැහැදිලි වේ. එම ප්‍රවේශය සිල්වා (2009) මතු කරන අදහස වන සැරසිලි මෝස්තර පොදු ජන විඥානය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ තර්කය හා සමගාමී වේ. ඒ අනුව සැරසිලි මෝස්තර පොදු ජන විඥානය තුළ ගොඩනඟන ලද සංජානනය මෙහි දී නිර්මාණ ශිල්පියා ආයුධ නිර්මාණය කිරීමට අවශ්‍ය සන්දර්භය ගොඩනඟා ගැනීමට උපක්‍රමික ව භාවිත කර තිබේ. ආවේශය, අවශ්‍යතාව සහ උපයෝගීතා භාණ්ඩය අතර සහසම්බන්ධතාව පවත්වා ගැනීම සංකල්ප භාවිතයේ දී දේශීය ශිල්පියාගේ උසස් ශිල්පීය ලක්ෂණයක් වශයෙන් හැඳින්විය හැකි ය. ඒ අනුව කස්තාන කඩුව සැරසිලිකරණය සඳහා සිංහ සංකල්පය යොදා ගැනීම හුදු සැරසිලි මූලයක් පමණක් ම නොවන බවත් සැලසුම්කරණ සාධකයක් වශයෙන් ද වැදගත් වී ඇති බවත් පැහැදිලි වේ. එනම්, සැරසිලිකරණය සැලසුම්කරණ අවශ්‍යතාව පූරණය කිරීම සඳහා ආවේශය වශයෙන් භාවිත කර ඇති බව හඳුනාගත හැකි ය. 11 රූපයෙන් දක්වා ඇති ආකාරයට කඩුවේ මූලික දෘශ්‍ය ස්වරූපය හා එහි ආරක්ෂාව පිළිබඳ ප්‍රකාශනය පවත්වා ගනිමින් දෘශ්‍ය සංකල්පීය මෝස්තර එක් කර ඇති ආකාරය හඳුනාගත හැකිය.

ඒ අනුව ආයුධ ආශ්‍රිතව පදගත සහ දෘශ්‍ය සංකල්පය භාවිතයෙන් නිර්මාණය කරන ප්‍රමුඛ ආයුධයක් වශයෙන් කස්තාන කඩුව දැක්විය හැකි ය. එහි දී නිෂ්පාදනයේ සන්නිවේදන හා ප්‍රකාශන අරමුණ සාධනය සඳහා සිංහ, ගුරුළු සහ මකර වැනි සංකල්ප පදගත සංකල්පයත් කඩුවේ ආකෘතික ගොඩනැංවීම සඳහා එම මෝස්තරවලට අදාළ දෘශ්‍ය ස්වරූපයත් සංවර්ධනය කර තිබේ (09 සහ 11 රූප බලන්න). මෙහි දී උක්ත මෝස්තර තුන භාවිත කිරීම පිළිබඳ අවධානය යොමු කළ යුතු වන්නේ ඒ ආශ්‍රිත දෘශ්‍ය සහ පදගත සංකල්පීය සුසංයෝගය ආයුධයේ ප්‍රකාශනය තීව්‍ර කරන අතරම කලාත්මක ඒකත්වය ආරක්ෂා කරගැනීමේ දී වැදගත් වී ඇති බැවිනි. එහෙත් කස්තාන කඩුව ආශ්‍රිත සැරසිලිකරණය පිළිබඳ විමසීමේ දී තුවක්කුවල මෙන් ඍජුව ම සිදු කරන ලද ආකෘතිමය ගොඩනැඟීමක් නිරීක්ෂණය නො වේ. එනම්, කඩුවේ මූලික ආකෘතියට අනුගත ව සැරසිලි මෝස්තර භාවිත කර ඇති අතර එම මෝස්තර මගින් මූලික ආකෘතිය ආවේණික ලක්ෂණ සහිත ආකෘතියක් දක්වා සංවර්ධනය කර ඇති ආකාරය නිරීක්ෂණය කළ හැකි ය (01, 02, 11 රූප බලන්න). ඒ සැරසිලි මෝස්තර උපක්‍රමිකව සංකල්පමය භාවිතයක් වශයෙන් අදාළ කර ගැනීම මගින් ප්‍රබල භාවමය ප්‍රකාශනයක් සිදු කිරීම මෙන්ම ආකෘතික වශයෙන් ආවේණික දෘශ්‍ය ස්වරූපයක් ගොඩ නැඟීමට ද ශිල්පියා සමත්ව ඇති බව පැහැදිලි වේ.


ආයුධ නිර්මාණකරණයේ දී පදගත සංකල්පය සහ දෘශ්‍ය සංකල්පය යන දෙක ම මෙන් ම දෘශ්‍යමය සංකල්පයෙන් පමණක් ආවේශය ලබාගත් අවස්ථා ද නිරීක්ෂණය කළ හැකි ය (03, 05, 07, 08, 12 රූපය බලන්න). එහෙත් ඒවා ද මුළුමනින්ම පදගත සංකල්පය බැහැර කර නොමැත. ඊට හේතු වී ඇතිතේ ජ්‍යාමිතික මෝස්තර හැර අනෙක් සියලුම දේශීය සාම්ප්‍රදායික සැරසිලි සඳහා යම් සංකල්පීය වටිනාකමක් හිමිව තිබීමයි (මුදියන්සේ, 1983). ඒ අනුව කස්තාන කඩුවේ හැර අනෙක් සියලුම ආයුධ ආශ්‍රිතව බහුල වශයෙන් නිරීක්ෂණය කළ හැක්කේ දෘශ්‍ය ස්වරූපය හා ආකෘතිය ගොඩනැඟීම සඳහා ආවේශය පදගත සංකල්පය ඉක්මවා ඉස්මතු වී තිබීමයි. එම ආයුධ ආශ්‍රිත සැරසිලිවල කස්තාන කඩුවේ මෙන් නිශ්චිත හා සෛද්ධාන්තික පදනමක් හෝ ප්‍රබල භාව ප්‍රකාශනයක් නිරීක්ෂණය කළ නොහැකි වීම මගින් පැහැදිලි වන්නේ ද එහි දී පදගත සංකල්පයට වඩා දෘශ්‍ය සංකල්පය ඉස්මතු වී ඇති බවයි. පිහා කැත්තේ ලියපත නිශ්චිත භාවිතයක් වුවද එහි සිංහ සංකල්පයේ මෙන් ප්‍රබල භාව ප්‍රකාශනයක් හඳුනාගත නොහැකිය. ඒ අනුව කස්තාන කඩුවේ හැර අනෙකුත් සියලුම ආයුධ නිර්මාණකරණයේ දී පදගත සංකල්පය ඉක්මවා සැරසිලි දෘශ්‍ය ආවේශය වශයෙන් භාවිත කරමින් ආයුධයේ දෘශ්‍ය ස්වරූපය ගොඩනඟා ඇති ආකාරය නිරීක්ෂණය කළ හැකිය.

මහනුවර යුගයේ ගිනි අවි ආශ්‍රිතව ද ආයුධයෙහි මූලික ආකෘතිය හා පෘෂ්ඨීය ස්වභාවය සංවර්ධනය කිරීම සඳහා ද සංකල්ප සංවර්ධන ප්‍රවේශය උපයෝගී කරගෙන ඇති ආකාරය නිරීක්ෂණය කළ හැකි ය. එම නිර්මාණ ආශ්‍රිතව දේශීය අනන්‍ය ශෛලීය ලක්ෂණ නිරීක්ෂණය කළ හැකි අතරම ගෝලීයව පිළිගත් ගිනි අවිවල මූලික ස්වරූපය ද ආරක්ෂා කර ගෙන ඇත්තේ එහි වෙඩි තැබීමේ උපයෝගිතාවට හානියක් නොවීම පිණිසය (12 රූපය බලන්න). එහි දී භාවිත සංකල්ප අතර මකර සහ ගුරුළු මෝස්තර ප්‍රමුඛ වේ. ගිනි අවි නිර්මාණකරණයේ දී මෙම ගුරුළු හෝ මකර සංකල්ප තුවක්කුවල ආකෘතිමය වශයෙන් මෙන් ම වයනය ආශ්‍රිත සංවර්ධනය කිරීම් සඳහා ද භාවිත කර තිබේ (13 A, B රූප බලන්න). ගුරුළු සහ මකර සංකල්පවල දෘශ්‍ය රූප තුවක්කුවේ ආකෘතිය කෙරෙහි සිදු කරන ලද බලපෑම එමගින් හඳුනාගත හැකි ය. 13 රූපයේ C මගින් දක්වා ඇති ජිංගල් තුවක්කුවේ හිස කොටස මකර සංකල්පය ඇසුරින් සහ A හා B මගින් දක්වා ඇති වඩනතුවක්කු දෙකෙහි හිස කොටස ගුරුළු සංකල්පය ඇසුරිනුත් සංවර්ධනය කර තිබේ. එහෙත් මෙම භාවිත ආශ්‍රිතව කස්තානයේ සිංහ සංකල්පය ස්ථානගත කිරීම හෝ පිහාකැත්තේ ලියපත ස්ථානගත කිරීම මෙන් සෛද්ධාන්තික භාවිතයක් නිරීක්ෂණය කළ නො හැකි ය. කෙසේ වුව ද මෙහි දී ආකෘතික

ගොඩනැංවීම සඳහා ආවේශය වශයෙන් භාවිත කරන ලද මකර හා ගුරුළු සංකල්පවල සංකේතාර්ථ ආයුධය වෙත ආරෝපණය කිරීම මගින් ආයුධය වෙත භාවමය ප්‍රකාශනයක් ලබා දීම සිදු කර තිබේ. එම ප්‍රකාශනය දෘශ්‍ය සංකල්පය හා පදගත සංකල්පය අතර පවතින සහසම්බන්ධතාව මත තීරණය වේ. එහෙත් මෙම භාව සමාජ සන්නිවේදනයක් සිදු කිරීමට තරම් ප්‍රබල සෛද්ධාන්තික භාවිතයක් නොවන බව නිශ්චිත දෘශ්‍ය ස්වරූපයක් හෝ ස්ථානගත කිරීමක් නොමැති වීමෙන් ප්‍රකට වේ. එහෙත් පුද්ගලිකව පරිශීලකයාගේ මනෝ භාව උත්තේජනය කිරීමේ දී වැදගත් භාවිතයක් බව පැහැදිලි වේ.




**රූපසටහන 12.** මහනුවර යුගයේ භාවිත දේශීය වඩන තුවක්කුවක සහ යුරෝපීය තුවක්කුවක ආකෘතික ලක්ෂණ. (මූලාශ්‍රය ඇසුරින් සංස්කරණය කරන ලද ඡායාරූපයකි)





**රූපසටහන 13.** සිංහල සැරසිලි සංකල්පවල ආවේශය ලබාගනිමින් නිර්මාණය කර ඇති තුවක්කු කිහිපයක් (ජාතික කෞතුකාගාරය, කොළඹ).

මෙසේ ගිනි අවිවල මූලික ආකෘතිය සඳහා සැරසිලි සංකල්පයන්හි ආවේශය නිරීක්ෂණය කළ හැකි අතර ම අවශේෂ කොටස්වල ආකෘතිමය ගොඩනැංවීම සඳහා ද සංකල්ප සංවර්ධනය කර ඇති ආකාරය නිරීක්ෂණය කළ හැකි ය. පහත 14 රූපයෙන් ඉදිරිපත් කර ඇති ගිනි අවි කොටස් ඊට නිදසුන් වේ.


මෙම මෝස්තර භාවිතය ආශ්‍රිතව නිශ්චිත දෘශ්‍ය ස්වරූපයක් නිරීක්ෂණය කළ නොහැකි අතර ඒ ඒ කොටසේ උපයෝගීතාව සහ ආයුධයේ මූලික ස්වරූපයට අනුරූපී ව සැරසිලි මෝස්තරයේ ස්වරූපය විවිධාකාර වේ. කෙසේ වුවද මෙම සැරසිලි භාවිතය ගිනි අවියේ ආකෘතික අනන්‍යතාව ගොඩනැගීමෙහිලා ඉවහල් වී තිබේ. එමෙන් ම මෙම සැරසිලි මෝස්තර ආශ්‍රිත සංකල්පීය අගයන් ආයුධය වෙත ආරෝපණය වුවත් ඒවායේ පරිමාණය හා දෘශ්‍ය ලක්ෂණ අනුව සැලසුමෙහි අදහස ප්‍රබල ව ප්‍රකාශ කිරීමක් වශයෙන් හඳුනාගැනීම අසීරුය. ඒ අනුව ගිනි අවි කොටස්වල ආකෘතික ගොඩනැංවීම සඳහා අවශ්‍ය දෘශ්‍යමය උත්තේජනය ලබා ගැනීම මෙහි දී ප්‍රමුඛ වී ඇති බව හඳුනාගත හැකිය. මෙම සංකල්ප තෝරා ගැනීමේ දී *වෛජයන්ත තන්ත්‍රයේ* (1983) නියමයන්ට අනුකූලව සිදු කර තිබීම ද වැදගත් සාධකයකි.




**රූපසටහන 14.** සංකල්පීය ආවේශය මගින් ගිනි අවිවල විවිධ කොටස්වල ආකෘතික ගොඩනැංවීම. A, C ජාතික කෞතුකාගාරය, කොළඹ., B, D ජාතික කෞතුකාගාරය, මහනුවර.




**රූපසටහන 15.** සාම්ප්‍රදායික ලියවැල ඇසුරින් තුවක්කුවල ආකෘතිය සඳහා අවශ්‍ය ආවේශය ලබා ගැනීම (මෙට්‍රොපොලිටන්ට් කෞතුකාගාරයේ තැන්පත් කර ඇති බොණ්ඩිකුලයේ ආකෘතිය දැක්වෙන චිත්‍ර සටහනක්) (කොළඹ ජාතික කෞතුකාගාරයේ තැන්පත් කර ඇති බොණ්ඩිකුලයේ ආකෘතිය දැක්වෙන චිත්‍ර සටහනක්)





**රූපසටහන 16.** සිංහල සැරසිලි මෝස්තර ඇසුරින් තුවක්කුවල ආකෘතිය සඳහා අවශ්‍ය ආවේශය ලබා ගැනීම (කොළඹ ජාතික කෞතුකාගාරයේ තැන්පත් කර ඇති බොණ්ඩිකුලයේ ආකෘතිය දැක්වෙන චිත්‍ර සටහනක්)

ඒ අනුව ආයුධ මහනුවර යුගයේ ආයුධ නිර්මාණ ක්‍රියාවලියේ දී සංකල්ප සංවර්ධන ක්‍රියාවලියට අදාළව සංකල්පය සහ ආවේශය යන සාධක දෙකම මෙන්ම ආවේශය ප්‍රමුඛ වූ අවස්ථා ද හඳුනාගත හැකිය. පහත චිත්‍ර සටහන් මගින් තුවක්කු නිර්මාණකරණයේ දී ආවේශය වශයෙන් දේශීය ශෛලිගත සැරසිලි භාවිත කර ඇති ආකාරය හඳුනාගත හැකි ය.

ඉහත 15 සහ 16 චිත්‍ර සටහන් ඇසුරින් ඉදිරිපත් කර ඇත්තේ මහනුවර යුගයේ දී නිෂ්පාදිත බොණ්ඩිකුල තුවක්කු දෙකක් සඳහා දේශීය සැරසිලිවල ආභාසය ලබාගෙන ඇති ආකාරයයි. ඒ අනුව තුවක්කු දෙකෙහි හිස කොටස්වල ආකෘතිමය ගොඩනැංවීම සඳහා සිංහල සැරසිලි මෝස්තර අතර ප්‍රචලිත ලියවැල් සහ ලියපත්වල ආභාසය නිරීක්ෂණය කළ හැකි ය. කඩුව හා පිහා කැත්ත ආශ්‍රිතව ද ආකෘතිමය වශයෙන් ආයුධයේ ස්වරූපය ගොඩනගා ගැනීම සඳහා සිංහල සැරසිලි මෝස්තර ආවේශය වශයෙන් භාවිත කර ඇතත් වඩාත් ප්‍රබල ව එහි බලපෑම තුවක්කු ආශ්‍රිතව නිරීක්ෂණය කළ හැකි ය. ගිනි අවි සහ පිහාකැත්ත සංවර්ධනයේ දී ද කඩුවේ මෙන් ම සංකල්පය හා ආවේශය භාවිත කර ඇතත් සංකල්පීය සන්නිවේදනය කඩුවේ තරම් ප්‍රබල නොවේ.

මෙම මෝස්තර ආශ්‍රිතව සංකේතාත්මක අර්ථ නිරූපණයක් දැකිය හැකි වුව ද ඒවා කෘතියට අදාළ කරගෙන ඇති ආකාරය අනුව සෘජු සංකේතාත්මක ප්‍රකාශනයක් නොවන බව පැහැදිලි වේ. මෙහි දී ආයුධයේ ඒ ඒ කොටස් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය දෘශ්‍යමය ආවේශය ලබා ගැනීමේ අරමුණින් සංකල්පීය සැරසිලි මෝස්තර භාවිත කර තිබේ. ඒ අනුව පොදුවේ ගිනි අවි නිර්මාණකරණයේ දී ද කඩුව හා පිහා කැත්ත ආශ්‍රිතව මෙන් ම සංකල්ප සංවර්ධන ප්‍රවේශයේ දෘශ්‍ය සංකල්පය හා පදගත සංකල්පය යන ආකාර දෙක ම භාවිත කර තිබේ. එහෙත් යොදාගෙන ඇති සංකල්ප ආශ්‍රිතව සෛද්ධාන්තික ලක්ෂණ නිරීක්ෂණය කළ නොහැකි ය. එමෙන් ම කස්තාන කඩුවේ සිංහ සංකල්පය භාවිතය මෙන් සංකල්පීය ප්‍රකාශනයක් කෙරෙහි උනන්දු වී නොමැති බව ද මෙහි දෘශ්‍ය ලක්ෂණ අධ්‍යයනයේ දී පැහැදිලි වේ. ඒ අනුව පිහාකැත්තේ මෙන් ම ගිනි අවි ආශ්‍රිතව ද නිරීක්ෂණය කළ හැකි වන්නේ පදගත සංකල්පීය ප්‍රවේශයකට වඩා දෘශ්‍යමය ආවේශය ලබා ගැනීමේ අරමුණින් සංකල්පීය මෝස්තර භාවිත කර ඇති බවයි. මෙසේ දේශීය සැරසිලි මූලිකාංග ඇසුරින් ආකෘතිමය ගොඩ නැංවීම සිදු කරන ලද තවත් වඩන තුවක්කු කිහිපයක චිත්‍ර සටහන් 17 රූපයෙන් ඉදිරිපත් කර තිබේ. මෙම තුවක්කුවල මූලික ආකෘතිය ගොඩනැගීම සඳහා දේශීය සැරසිලි මූල සංවර්ධනය කර භාවිතයට ගෙන ඇති ආකාරය හඳුනාගත හැකි ය. විශේෂයෙන් වකදෙක මෝස්තරය ආශ්‍රිත මූලික රේඛා හැසිරවීම්වල ආභාසය මෙන් ම ලියපත් සැරසිලිවල ආභාසය මෙම තුවක්කු ආශ්‍රිතව නිරීක්ෂණය කළ හැකි ය.




**රූපසටහන 17.** දේශීය වඩන තුවක්කු කිහිපයක හිස කොටසේ ආකෘතික ගොඩනැගීම දැක්වෙන චිත්‍ර සටහන් කිහිපයක්. (කොළඹ සහ මහනුවර ජාතික කෞතුකාගාරවල තැන්පත් කර ඇති තුවක්කු ඇසුරින් කරන ලද චිත්‍ර සටහනක්) )




**රූපසටහන18.** වඩන තුවක්කුවේ භාවිතය (මූලාශ්‍ර ඇසුරින් සංස්කරණය කරන ලද ඡායාරූපයකි)



**රූපසටහන 19.** වඩන තුවක්කුවේ භාවිතය (දඹුලු විහාරයේ සිතුවමක් ඇසුරිනි)



**රූපසටහන 20.** ලියපත මගින් ආවේශය ලබා ගනිමින් නිර්මාණය කරන ලද පිහාකැත්ත මිට. (නියැදියට අදාළ ප්‍රාථමික මූලාශ්‍රය ඇසුරින් කරන ලද චිත්‍ර සටහනකි)



**රූපසටහන 21.** දේශීය සැරසිලි සහිත අත්තුවක්කුවක චිත්‍ර සටහනක්.
(මහනුවර ජාතික කෞතුකාගාරයේ තැන්පත් කර ඇති අත්තුවක්කුවක් ඇසුරින්)

ඒ අනුව සැරසිලි මූලිකාංග ගිනි අවිවල භෞතික ආකෘතිය ගොඩනැංවීම සඳහා දෘශ්‍ය සංකල්පය හෙවත් ආවේශය වශයෙන් භාවිත කර ඇති ආකාරය ඉහත සාකච්ඡාවෙන් පැහැදිලි වේ. එහි දී ආයුධයෙහි උපයෝගීතාව සහ ක්‍රියාකාරීත්වය යන සැලසුම්කරණ සාධක ආරක්ෂා කර ගෙන ඇති අතරම ආකෘතිය ආවේණික ලක්ෂණ සහිත නිර්මාණයක් දක්වා සංවර්ධනය කර තිබේ. එහි දී ගෝලීයව පිළිගත් තුවක්කුවේ ආකෘතිය ඉක්මවා සැරසිලි කර ඇතත් මූලික ව්‍යවහාරික පදනම ආරක්ෂා කරගෙන තිබේ. මෙසේ සැරසිලි මෝස්තරවල ආභාසය ලබා ගනිමින් අයුධවල ආකෘතිය සංවර්ධනය කර තිබුණ ද ඒවායේ උපයෝගීතාවට අදාළ මානව සාධක රැක ගැනීම කෙරෙහි ද ශිල්පියා අවධානය යොමු කර ඇති බව 18 සහ 19 රූප ඇසුරින් පැහැදිලි වේ.


පිහා කැත්ත ආශ්‍රිතව ද දේශීය සැරසිලි වැඩි වශයෙන් දැකිය හැකි අතර එහි ආකෘතික ගොඩනැංවීම කෙරෙහි සැරසිලි මූලයන්හි ආභාසය නිරීක්ෂණය කළ හැකිය. මෙම ආයුධය ආශ්‍රිතව සියුම් සැරසිලි බහුල ය. එහෙත් ඒවා වෙන් වෙන් ව නිරීක්ෂණය කිරීමේ දී ආයුධයේ මතුපිට සැරසිලිකරණය සඳහා භාවිත කරන ලද බව දෘශ්‍යමාන වේ. එහෙත් පිහාකැත්තේ සමස්ත ආකෘතිය කෙරෙහි දේශීය සැරසිලිවල ආවේශය ලබාගෙන ඇති ආකාරය ආකෘතික ලක්ෂණ නිරීක්ෂණය කිරීමේ දී පැහැදිලි වේ. එහි ආකෘතික සංවර්ධනය කෙරෙහි සැරසිලි මූලයන්හි බලපෑම පහත චිත්‍ර සටහන ඇසුරින් නිරීක්ෂණය කළ හැකි ය (20 රූපය).

ඉහත 20 චිත්‍ර සටහන ආශ්‍රිතව පිහාකැත්තේ මිටෙහි ආකෘතිය ගොඩනැගීමේ දී ලියපත ආවේශය වශයෙන් ගෙන ඇති ආකාරය නිරීක්ෂණය කළ හැකි ය. එමෙන් ම පිහා කැත්තේ මිටෙහි ආකෘතික ලක්ෂණ සහිත අත් තුවක්කුවක් ද දේශීය ආයුධ නිර්මාණ අතර දැකිය හැකි ය (21 රූපය). එහි ආකෘතික ගොඩනැගීම සඳහා ද පිහා කැත්තේ මෙන් ම ලියපත ආභාසය කරගෙන ඇති ආකාරය නිරීක්ෂණය කළ හැකි ය.


ආයුධ සැරසලිකරණය අශ්‍රිතව විවිධ සංකල්පීය මෝස්තර දැකිය හැකි වුවත් කස්තාන කඩුව ආශ්‍රිත සංකල්පීය රූප මෙන්, නිශ්චිත සෛද්ධාන්තික භාවිතයක් නිරීක්ෂණය කළ හැක්කේ පිහා කැත්ත ආශ්‍රිතව පමණි. එහි දී බහුල වශයෙන් පලාපෙත්ත හා ලියපත පිහා කැත්තේ ආකෘතික ගොඩනැංවීම සඳහා දෘශ්‍ය ආවේශය වශයෙන් භාවිත කර තිබේ. එහෙත් පලා පෙත්ත ආශ්‍රිතව සිංහ, මකර හෝ ගුරුළු මෝස්තර මෙන් ප්‍රබල සංකේතාත්මක අර්ථ නිරූපණයක් දැකිය නොහැකි බැවින් පිහා කැත්ත කෙරෙහි ඇති කරනු ලබන සංකේතාත්මක බලපෑම අවම ය. එහි දී පිහා කැත්තේ මූලික ආකෘතිමය ගොඩනැගීම සඳහා දෘශ්‍ය ආවේශය වශයෙන් පලාපෙත්ත සහ ලියපත මෝස්තර සංවර්ධනය කර තිබේ. එහෙත් බහුල වශයෙන් නොවුණ ද පිහා කැත්තේ සැරසිලි මෝස්තර අතර සංකල්පීය මෝස්තරයක් වන ගුරුළු මෝස්තරය නිරූපණය කර ඇති අවස්ථා දැකිය හැකි ය (22 රූපය).

ලියපත ඇසුරින් සංවර්ධනය කරන ලද පිහාකැත්ත දෙකක් සහ ගුරුළු මෝස්තරය ඇසුරින් වැඩි දියුණු කරන ලද පිහා කැත්තක් ඉහත 22 රූපය මගින් ඉදිරිපත් කර තිබේ. එම රූපවල දෘශ්‍ය ලක්ෂණ තුලනය කිරීමේ දී ගුරුළු සංකල්පය ලියපත් සංකල්පයට වඩා ප්‍රබලව සංකේතතාත්මක ව ඉස්මතු වන අතර ලියපත ඇසුරින් සංවර්ධනය කර ඇති ආයුධය මගින් සංකේතාත්මක ප්‍රකාශනයකට වඩා කලාත්මක ප්‍රකාශනයක් දැකිය හැකි ය. ඊට හේතුව වන්නේ ලියපත මෝස්තරය ආශ්‍රිතව නිරීක්ෂණය කළ හැකි රිද්මයානුකූල දෘශ්‍ය ස්වරූපයෙහි ආභාසය ලැබී තිබුණ ද සංකේතාත්මක නිරූපණයක් කිරීමට තරම් ප්‍රබල ප්‍රකාශනයක් ලියපත මෝස්තරයෙහි නොමැති වීමයි. එනම් *වෛජයන්ත තන්ත්‍රයට* (1983) අනුව දේශීය සාම්ප්‍රදායික ලියපත යම් දිව්‍යමය සංකල්පයක් වුවද එය සිංහ ගුරුළු හෝ මකර සංකල්ප මෙන් ප්‍රබල භාව ප්‍රකාශනයක් නිරීක්ෂණය කළ නොහැකි වීමයි. 22 රූපයේ චිත්‍රණය කරන ලද ආකෘති විමසීමේ දී ගුරුළු මෝස්තරය හා ලියපත පිහිය මිට ආශ්‍රිත ව වැඩිදියුණු කිරීමේ දී මූලික ආකෘතික හැඩයේ සමාන ලක්ෂණ නිරීක්ෂණය කළ හැකි ය. එහෙත් ගුරුළු මෝස්තරය ලියපතට වඩා භාව ප්‍රකාශනය අතින් ප්‍රබලය. එසේ වුවද කස්තාන කඩුවේ සිංහ සංකල්පය මෙන් පිහා කැත්ත ආශ්‍රිතව මකර හෝ ගුරුළු සංකල්ප සෛද්ධාන්තික භාවිතයක් නිරීක්ෂණය කළ නොහැකිය.


එමෙන් ම හෙල්ල තලයෙහි ආකෘතික ගොඩනැංවීමේ දී සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර මෙන්ම ස්වාභාවික වස්තූන් ද ආවේශය වශයෙන් ගෙන ඇති ආකාරය නිරීක්ෂණය කළ හැකිය. එහි දී සාම්ප්‍රදායික මෝස්තර වශයෙන් ලියපත (23 A), ගුරුළු මෝස්තරය (23 A) ආකෘතික ගොඩනැංවීම සඳහා භාවිත කර ඇති ආකාරය හඳුනාගත හැකිය. එමෙන් ම ස්වභාවික පත්‍ර (24 B) සහ හස්තියෙකුගේ ආවේශය (23 B) ඇසුරින් සංවර්ධනය කරන ලද හෙල්ල තලයක් ද හමු වේ. මෙම සංකල්පීය යෙදවුම් ආශ්‍රිතව නිශ්චිත ස්ථානගත කිරීමක් දැකිය නොහැකි අතර එවැනි ආයුධ ප්‍රමාණයෙන් ද සීමිත වේ. ඒ අනුව මෙම සංකල්ප භාවිතයේ දී පදගත සංකල්පයට වඩා ආවේශය හෙවත් දෘශ්‍ය සංකල්පය ප්‍රමුඛ වී ඇති බව නිරීක්ෂණය කළ හැකිය.



**රූපසටහන 22.**ලියපත සහ ගුරුළු සංකල්පය මගින් ආවේශය ලබා ගනිමින් නිර්මාණය කරන ලද පිහාකැත්ත මිට කිහිපයක් සහ ඒවායේ චිත්‍ර සටහන් (ජාතික කෞතුකාගාරය, මහනුවර).




**රූපසටහන 23.** දේශීය සැරසිලි මෝස්තර ඇසුරින් සැරසිලි  කරන ලද හෙල්ල තල දෙකක් (A - ජාතික කෞතුකාගාරය, කොළඹ., B - ජාතික කෞතුකාගාරය, මහනුවර)




**රූපසටහන 24.** ආකෘතිමය සැරසිලි සහිත දේශීය හෙල්ල (ජාතික කෞතුකාගාරය, මහනුවර)

දුනු හී සහ පොරව වැනි ආයුධ නිර්මාණකරණයේ දී ආකෘතිමය ගොඩනැඟීමට වඩා දෘශ්‍යමය අරමුණින් සැරසිලි භාවිත කර ඇති බව ඒවායේ දෘශ්‍ය ස්වරූපය විමසීමේ දී පැහැදිලි වේ. එනම් එම ආයුධ සඳහා සැරසිලිකරණ මෝස්තර යොදාගෙන ඇතත් ඒ මතුපිට අලංකරණය සඳහා පමණක් වීමයි. එම ආයුධ ආශ්‍රිතව භාවිත සැරසිලිවල පරමාර්ථය වී ඇත්තේ ආයුධය මත කලාත්මක උත්තේජනයක් ලබා දීම වන අතර සංකල්පීය සංවර්ධන ප්‍රවේශය ආශ්‍රිත ආකෘතික ලක්ෂණ නිරීක්ෂණය කළ නොහැකිය. ඊට හේතුව වන්නේ අනෙකුත් ආයුධ මෙන් සැරසිලි මෝස්තර ඇසුරින් සිදු කරන ලද ආකෘතිකමය ගොඩ නැඟීමක් නිරීක්ෂණය කළ නොහැකි වීමයි. බොහෝ දුරට එම ආයුධවල වයනය සැරසිලිකරණ යෙදවුම් මගින් අලංකරණය කර ඇති අතර ප්‍රබල සංකේතාත්මක ප්‍රකාශනයක් නිරීක්ෂණය කළ නො හැකි ය. එහෙත් මෙම භාවිතය ආශ්‍රිතව ද කලාත්මක භාවිතය ඉක්ම වූ සැලසුම්කරණ භාවිතයක් හඳුනාගත හැකිය. එනම් ආයුධයේ මූලික ආකෘතිය වෙත සෞන්දර්යාත්මක දෘශ්‍ය ප්‍රකාශනයක් ලබා දීම මගින් යුධමය භාවිතය සමාජ භාවිතයක් බවට පත් කිරීම සඳහා සිදු කරන ලද උපක්‍රමික භාවිතයක් වශයෙන් හඳුනාගත හැකිය. ඊට හේතුව වන්නේ ආරක්ෂක උපයෝගිතාව ඉක්ම වූ දෘශ්‍ය ලක්ෂණ නිරීක්ෂණය කළ හැකි වීමයි.

මහනුවර යුගයේ ආයුධ ආශ්‍රිත සැරසිලිකරණය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී, ව්‍යවහාරික කලාව තුළ පිරිසිදු කලාවට ස්වාධීන ව පැවතිය නොහැකි බව පවසන හැන්සන්ගේ (2005) න්‍යායික පදනම මෙහි දී වැදගත් වේ. එනම් ව්‍යවහාරික කලා කුලකයට අයත් වන ආයුධ ආශ්‍රිත සැරසිලි මෝස්තර ස්වාධීන යෙදවුමක් නොවන බවයි. ඉහත ආයුධ ආශ්‍රිත සැරසිලිකරණ යෙදවුම් පිළිබඳ සාකච්ඡාවේ දී ඒ බව පැහැදිලි වේ. ඒ අනුව මහනුවර යුගයේ ආයුධ සැරසිලිකරණයේ දී භාවිත මෝස්තර ශිල්පීය හා උපක්‍රමික භාවිතයක් වශයෙන් හඳුනාගත හැකිය.

ඒ අනුව ආයුධ නිර්මාණකරණයේ දී සැරසිලි මෝස්තර කලාත්මක අරමුණ ඉක්මවූ සැලසුම් ශිල්පීය අවශ්‍යතා සඳහා අදාළ කරගෙන ඇති බව පැහැදිලි වේ.

1. ආකෘතිකමය ගොඩ නැංවීම
2. සංකල්පීය ආවේශය ලබා ගැනීම
3. වයනය ආශ්‍රිත දෘශ්‍යමය අවකාශය ගොඩනැඟීම (කලාත්මක ඒකත්වය)

ආකෘතිමය ගොඩනැඟීම සඳහා සැරසිලි භාවිතය ආයුධයේ මතුපිට සැරසිලිකරණයට වඩා සංකීර්ණ ප්‍රවේශයකි. එනම්, වයනය මත සැරසිලි යෙදීමේ දි සැරසිලි යෙදිය යුතු ආකෘතික සීමාව හඳුනාගත හැකි වුවත් මෙම සැරසිලි භාවිතය මගින් ආයුධයේ ආකෘතිය වෙනස් කිරීම කෙරෙහි බලපෑම් ඇති කර තිබේ. එහි දී ශිල්පියාට එහි කලාත්මක භාවිතය කෙරෙහි පමණක් අවධානය යොමු කළ නො හැකි ය. එනම්, ආයුධයේ උපයෝගීතාව සහ මානව සාධක යන සැලසුම්කරණ සාධක පිළිබඳ සැලකිලිමත් විය යුතු වීමයි. මෙම ප්‍රවේශයේ දී හැන්සන් (2005) ඉදිරිපත් කරන න්‍යායික සිද්ධාන්තයට අනුව ආයුධ නැමැති ව්‍යවහාරික නිර්මාණ ආශ්‍රිත කලාත්මක භාවිතය සම්පූර්ණයෙන් ම නිදහස් නොවන බව දේශිය තුවක්කු ආශ්‍රිත සැරසිලි භාවිතය ඇසුරින් පැහැදිලි වේ. මෙම ආයුධවල කලාත්මක යෙදවුම් උපයෝගීතාව හා භාවිතය මත පදනම් වූ සාධකයක් බව පැහැදිලි ය. මෙහි දී විශේෂයෙන් ම මානව සාධක යන සැලසුම්කරණ මූලය පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.

ආයුධයක උපයෝගිතාව යනු මූලික අවශ්‍යතාව පූරණය කිරීම සඳහා වන ප්‍රායෝගික භාවිතයයි. ව්‍යවහාරික කලා නිර්මාණ ප්‍රායෝගික භාවිතයේ දී මානව ශරීරය හා සම්බන්ධ වේ. ඒ අනුව නිෂ්පාදනයේ භාවිතය අනුව මානව ශරීරාංග සමග ගැටේ. මෙම ගැටීම වඩාත් සුවපහසු සම්බන්ධතාවක් බවට පත් කිරීම සැලසුම් ශිල්පීය ප්‍රවේශයකි. ඕනෑම ව්‍යවහාරික කලා නිර්මාණයක ව්‍යවහාරික අගය මානව සාධක මත පදනම් වේ. ඒ අනුව ආයුධවල සැරසිලිකරණය වැනි කලාත්මක යෙදවුම් මානව සාධක හා එහි උපයෝගිතාවට අදාළ සීමාවන්ට යටත් වේ. එම සැලසුම් ශීල්පීය ප්‍රවේශය මහනුවර යුගයේ ආයුධ ආශ්‍රිතව ද නිරීක්ෂණය කළ හැකි ය. මහනුවර යුගයේ නිෂ්පාදිත ගිනි අවි ආශ්‍රිතව මෙම ලක්ෂණය හඳුනාගත හැකිය. එනම් අත්තුවක්කුවක හෝ වඩන තුවක්කුවක ගෝලීය ආකෘතිය දේශීය ආවේණික ආකෘතියක් ඔස්සේ සංවර්ධනය කර ඇති ආකාරය පැහැදිලි වේ. එහි දී තුවක්කුවේ ආරක්ෂක උපයෝගිතාවට අදාළ මානව සාධක පිළිබඳ අවධානය යොමු කරමින් තුවක්කුවේ ආකෘතිය සැරසිලි මූලයන් ඇසුරින් සංවර්ධනය කිරීමයි. 13, 15, 16, සහ 17 රූප සටහන් මගින් ඒ බව පැහැදිලි වේ. කඩුව හා පිහා කැත්ත ආශ්‍රිතව ද ආකෘතික ගොඩ නැංවීම සඳහා දේශීය සැරසිලි මෝස්තර භාවිත කර ඇති ආකාරය මෙම අධ්‍යයනයේ දී හඳුනාගත හැකි විය. ඒ අනුව ආයුධ නිර්මාණකරණයේ දී සැරසිලි කලාත්මක යෙදවුමක් වශයෙන් භාවිත කර ඇතත් ඒ තාක්ෂණික වශයෙන් සැලසුම් සාධකයන්ට යටත් ව බව පැහැදිලි වේ.

හැල්ස්කොව් සහ ඩල්ස්ගාර්ඩ්ට අනුව (2008) සංකල්ප සංවර්ධන ප්‍රවේශය ආශ්‍රිත ප්‍රමුඛ සාධක දෙකක් වන සංකල්පය සහ ආවේශය නව අදහස් ජනනය කිරීමෙහි ලා වැදගත් වේ. සංකල්පය සහ ආවේශය යන සැලසුම්කරණ සාධක නිෂ්පාදනය කෙරෙහි ප්‍රවේශ දෙකක් ඔස්සේ බලපා තිබේ. එම ප්‍රවේශ දෙක වන්නේ, ආයුධයේ ආකෘතික ගොඩනැංවීම සඳහා දෘශ්‍ය සංකල්පය වශයෙන් මෙන් ම මූලික අදහස සන්නිවේදනය සඳහා අවශ්‍ය පදගත සංකල්පය වශයෙනි. එම ප්‍රවේශ දෙක අන්තර්සම්බන්ධිත ය. මෙම අධ්‍යයනයට පාදක වූ

ආයුධ ආශ්‍රිතව මෙම සැලසුම්කරණ සාධක බහුල ව නිරීක්ෂණය කළ හැකි ය. බොහෝ විට ආයුධවල අපේක්ෂිත අරමුණ අනුව මෙම ප්‍රවේශ දෙක ම භාවිත කර තිබේ එනම්, සංකේතාත්මක සහ ආකෘතික වශයෙන් අවශ්‍ය පිටුබලය ලබා ගැනීමයි. ඒ අනුව ආයුධ ආශ්‍රිතව සැරසිලි භාවිතය මගින් ඉහත සාකච්ඡා කළ කලාත්මක හෝ භාවමය අරමුණ මෙන්ම සැලසුම්කරණ ලක්ෂණ ද ප්‍රකට වේ. කස්තාන කඩුවේ දෘශ්‍ය ලක්ෂණ ආශ්‍රිතව මෙම ලක්ෂණ ප්‍රකට වේ. එහි දී සැරසිලිකරණ යෙදවුම්වල දෘශ්‍යමය හා සංකේතාත්මක ශක්‍යතාව උපයෝගී කොට ගනිමින් ආයුධය සමාජ දේශපාලනික නියෝජනයක් බවට පත් කර තිබේ. සැරසිලි සංකල්පයන්හි භාවමය ප්‍රකාශනය මෙන්ම දෘශ්‍ය ලක්ෂණ යන සාධක දෙකම සැලසුම්කරණ ප්‍රවේශයේ දී වැදගත් වේ. එනම් ආයුධවල ආකෘතිය ගොඩනැගීම සඳහා සැරසිලි මෝස්තර දෘශ්‍ය ආවේශය වශයෙන් ගැනීමත් ආයුධයෙහි ප්‍රකාශන කාර්ය සඳහා සැරසිලි සංකල්පයන්ගේ පදගත ආවේශය ලබා ගැනීමත්ය. ඒ අනුව ආයුධ නිර්මාණකරණයේ දී සැරසිලි භාවිතය දෘශ්‍යමය ආවේශය සහ පදගත සංකල්පය වශයෙන් උපක්‍රමිකව භාවිත කර ඇති ආකාරය පිළිබඳව මෙමගින් අධ්‍යයනය කර තිබේ.

සැරසිලිකරණය පිළිබඳ විමසීමේ දී ආකෘතිය මූලික සාධකයක් වන්නේ, සැරසිලිකරණ යෙදවුම් කළමනාකරණය කළ යුත්තේ එක් එක් ආයුධය සඳහා වන මූලික ආකෘතික අවකාශය මත වන බැවිනි. එනම්, සැරසිලිකරණය හෝ කලාත්මක භාවිතය කෙරෙහි භෞතික අවකාශය සීමා වීමයි. එහි දී පිරිසිදු කලා කෘතියක මෙන් කලාත්මක යෙදවුම් භාවිත කිරීමට ශිල්පියාට අවකාශ නො ලැබේ. ඒ අනුව සැරසිලිකරණය මූලික ව ම ආකෘතික සීමාවකට යටත් ව තිබේ. ආකෘතිය කිසියම් දුරකට සංවර්ධනය කිරීමේ හැකියාව ලැබුණ ද එහි ක්‍රියාකාරීත්වය පවත්වා ගැනීමට සිදුවීම හේතුවෙන් එය ද යම් සීමාවකට යටත් වේ. ඒ අනුව දේශීය ආයුධ සැරසිලිකරණය කෙරෙහි බලපානු ලැබූ දෙවන සැලසුම්කරණ මූලය වන්නේ එහි ක්‍රියාකාරීත්වයයි. උදාහරණයක් වශයෙන් තුවක්කුවේ ක්‍රියාකාරීත්වය කෙරෙහි බලපාන මූලික උපාංග සහ එහි සැකැස්ම නිසියාකාර ව පවත්වා ගැනීම හෝ කඩුවේ නම් කඩු තලය සහ මිටෙහි ස්වරූපය භාවිතයට අපහසු නොවන ආකාරයෙන් පවත්වාගත යුතු වීම දැක්විය හැකි ය.

එමෙන් ම සැරසිලිකරණය කෙරෙහි බලපාන අනෙක් සීමාව වන්නේ ආයුධයෙහි උපයෝගිතාවයි. එනම්, තත්කාලීන සමාජ අවශ්‍යතාව හඳුනාගෙන ඊට අනුරූපීව සැරසිලිකරණ යෙදවුම් කළමනාකරණය කළ යුතු වීමයි. එහි දී සැරසිලිකරණය ස්වාධීනව හැසිරවීමට ශිල්පියාට අවකාශ නොලැබෙන අතර බාහිර සමාජ අවශ්‍යතාවයකට අනුරූපීව කලාත්මක යෙදවුම් භාවිත කළ යුතු ය.

ක්‍රියාකාරී සෞන්දර්යවාදී න්‍යාය (හැන්සන්, 2005) ඔස්සේ විමසීමේ දී ක්‍රියාකාරීත්වය සහ උපයෝගිතාව යන සාධකවලට යටත්ව කලාත්මක යෙදවුම් අදාළ කර ගත යුතු අතර ඊට සමගාමී ව මානව සාධක පිළිබඳව ද අවධානය යොමු කළ යුතු වේ. එනම්, උපයෝගිතාව සහිත නිෂ්පාදනයක් වශයෙන් පරිශීලක අවශ්‍යතාව ඉටුකිරීමේ දී මානව ශරීරය කෙරෙහි දක්වන නම්‍යශීලීත්වයයි. එහි දී ආයුධ සැරසිලිකරණය මගින් එහි මානව සාධකවලට හානියක් නොවන ආකාරයට කළමනාකරණය කළ යුතුය. ඒ අනුව සැරසිලිකරණය කෙරෙහි වූ තවත් සීමාවක් වශයෙන් මානව සාධක හඳුන්වා දියහැකි ය. පිරිසිදු කලා කෘතියක කලාත්මක යෙදවුම් භාවිතය ස්වාධීන ව සිදු කිරීමේ හැකියාව ශිල්පියාට ලැබුණත් ව්‍යවහාරික කලා නිර්මාණයක් වන ආයුධ සැරසිලිකරණයේ දී සැරසිලිකරණ යෙදවුම්, මෙහි දක්වා ඇති සැලසුම්කරණ මූලයන්ට යටත් ව සිදු කළ යුතු වූ බව පැහැදිලි වේ. ආයුධවල දෘශ්‍ය ස්වරූපය සංවර්ධනය කිරීම සඳහා සැරසිලි මෝස්තර අදාළ කර ගැනීමේ දී සැරසිලි මෝස්තර උපක්‍රමික භාවිතයක් වශයෙන් හඳුනාගත හැකිය.

ආයුධ සැරසිලිකරණය ආශ්‍රිතව භාවිත සැරසිලි මූලයන් ආයුධ නිර්මාණයන්හි දෘශ්‍ය ප්‍රකාශනය කෙරෙහි ඇති කරන බලපෑම සහ ආකෘතිමය ගොඩනැංවීම සඳහා භාවිත කර ඇති ආකාරය ඉහත සාකච්ඡා කර තිබේ. එමගින් සැරසිලි මෝස්තර ආශ්‍රිත භාවමය ප්‍රකාශනය සැලසුම්කරණ සාධකයක් වශයෙන් ආයුධවල උපයෝගිතාව කෙරෙහි ඇති කරන ලද බලපෑම පැහැදිලි වේ. එනම් ආයුධ සැරසිලිකරණය මගින් ඇති කරන ලද කලාත්මක හා භාවමය උත්තේජනය සැලසුම් ශිල්පීය උපක්‍රමයක් වශයෙන් භාවිත කරමින් සමාජ අවශ්‍යතාව මත පදනම් ව ආයුධ, හිංසාකාරී ප්‍රකාශනය ඉක්ම වූ සමාජීය නිෂ්පාදනයක් බවට පත් කිරීමයි. මෙම ප්‍රවේශයයේ දී සැරසිලිකරණ යෙදවුම් ඇසුරින් ආයුධවල දෘශ්‍ය ස්වරූපය හා ආකෘතිය සංවර්ධනය කර ඇතත් එහි ක්‍රියාකාරී කොටස් වලට බාධාවක් සිදුකර නොමැති බව ද හඳුනාගත හැකිය. ඒ අනුව ආයුධයේ මූලික උපයෝගිතාව ආරක්ෂා කර ගනිමින් උපක්‍රමිකව සැරසිලි මෝස්තර සැලසුම් ශිල්පීය පදනමක පිහිටා අදාළ කරගෙන ඇති ආකාරය මෙම සාකච්ඡාව මගින් පැහැදිලි වේ.

## 4. නිගමන සහ නිර්දේශ

සැරසිලි මෝස්තර කලාත්මක පදනමක් සහිත භාවිතයක් වුවත් මහනුවර යුගයේ ආයුධ නිර්මාණකරණයේ දී සැරසිලි මෝස්තර ආශ්‍රිතව කලාත්මක ලක්ෂණ ඉක්ම වූ සැලසුම්කරණ ලක්ෂණ නිරීක්ෂණය කළ හැකිය. ඒ අනුව මහනුවර යුගයේ ආයුධ නිර්මාණකරණයේ දී භාවිත සැරසිලි මෝස්තර සැලසුම්කරණ සාධකයක් වශයෙන් දෘශ්‍ය හා ආකෘතික ගොඩනැංවීම සඳහා සිදු කරන ලද ශිල්පීය යෙදවුමකි. මෙහි දී සැරසිලි මෝස්තර සතු භාවමය, දෘශ්‍යමය හා ආකෘතික ගතිකයන්

උපක්‍රමිකව ආයුධ නිර්මාණකරණය සඳහා භාවිත කර තිබේ.

මෙම පර්යේෂණයේ සොයා ගැනීම් සමකාලීන අනෙකුත් කලා හා කලාශිල්ප නිෂ්පාදන සඳහා අදාළ කර ගැනීම මගින් ගෝලීය වශයෙන් ශ්‍රී ලාංකේය අනන්‍යතාව නිරූපණය කිරීම මෙන්ම නිෂ්පාදනවල වයනය හා ආකෘතික වැඩිදියුණු කිරීම් මගින් වෙළඳපළ අගය වැඩි දියුණු කිරීමේ විභවයක් පවතී. එමෙන්ම මහනුවර යුගයේ ආයුධ නිර්මාණකරණයේ දී භාවිත සැරසිලිකරණ යෙදවුම් හුදු කලාත්මක භාවිතය ඉක්ම වූ සැලසුම් ශිල්පීය භාවිතයක් වන අතර මෝස්තරවලට අමතරව අමුද්‍රව්‍ය සංකලනය, තාක්ෂණික භාවිතයන් හා දෙමුහුන්කරණ ලක්ෂණ පිළිබඳ අධ්‍යයනය කිරීම ඉදිරි පර්යේෂණ යෝජනා ලෙස මෙම අධ්‍යයනයේ නිර්දේශ වශයෙන් දැක්විය හැකිය.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ


මුදියන්සේ, එන්. (1983). *වෛජයන්ත තන්ත්‍රය.* කැලණියඃ කැලණිය විශ්වවිද්‍යාලය.

සිල්වා, එන්. ඩී. (2009). සිංහල චිත්‍රය සහ මෝස්තර සම්ප්‍රදාය. කොළඹඃ පද්මපාණී නිර්මාණ ප්‍රකාශකයෝ.

සෙනෙවිරත්න, ඩී. ආර්. (1967). *චතුෂෂ්ෂට්ට කලා.* කොළඹඃ සමයවර්ධන මුද්‍රණාලය.

Buchanan, R. (1992). Wicked Problems in Design Thinking. *Design Issues, 8*(2), 5-21. Retrieved Apri 28, 2021, from https://www.jstor.org/stable/1511637

Barron, E. (2010). *Late Assyrian Arms and Armour: Art Versus Artifact* (Doctoral thesis, Toronto, University of Toronto). Retrieved November 02, 2019, from https://tspace.library.utoronto.ca/bitstream/1807/24677/7/Barron_Amy_E_201006_PhD_thesisplates.pdf

Brunning, S. E. (2013). The *'Living' Sword in Early Medieval Northern Europe: An Interdisciplinary Study* (Doctoral thesis. London: University College London). Retrieved October 16, 2019, from https://discovery.ucl.ac.uk/id/eprint/1416279/1/S%20Brunning%20PhD%20UCL%20Vol%201.pdf

Cardoso, C., & Badke-Schaub, P. (2011). Fixation or Inspiration: Creative Problem Solving in Design. *The Journal of Creative Behavior*. 45. 77-82. Retrieved June 16, 2021, from https://www.researchgate.net/publication/272919490_ Fixation_or_Inspiration_Creative_Problem_Solving_in_Design/citation/download

Coomaraswamy, A. (1913). Arts *& Craft of India and Ceylon*. London: T. N. Foulis.

Coomaraswamy, A. (2012). *Medieval Sinhalese Arts* (3rd ed.). Colombo: National Museum. (Original work Published 1908)

Daraniyagala, P.E.P. (1959). *Some Sinhala Combative. Field and Aquatic Sports and Games*, Colombo: National Museum.

Davy, J. (1821). *An account of the interior of Ceylon, and of its inhabitants.* Retrieved May 13, 2021, from https://forgottenbooks.com/de/download/AnAccountofthe InteriorofCeylonandofItsInhabitants_10598193.pdf

Ethridge, C. E. (2007). *Reinventing the sword: A cultural comparison of the development of the sword in response to the advent of firearms in Spain and Japan* (Master's Thesis, Louisiana, United States: Louisiana State University). Retrieved from https://digitalcommons.lsu.edu/gradschool_theses/3729

Halskov, K., & Dalsgaard, P. (2007). the emergence of ideas: the interplay between sources of inspiration and emerging design concepts. *Codesign*. 3. 185-211. Retrieved April 28, 2021, from https://www.researchgate.net/publication/ 240954005_The_emergence_of_ideas_the_interplay_between_sources_of_inspiration_and_emerging_design_concepts

Hanson, S. O. (2005). Aesthetic Functionalism, *Contemporary Aesthetics,*

3, 1-6. Retrieved March 05, 2021, from https://quod.lib.umich.edu/c/ca/7523862.0003.008/--aesthetic-functionalism?rgn=main;view=fulltext

Howard, T. J., Culley, S. J., & Dekoninck. E. A. (2008). Describing the creative design process by the integration of engineering design and cognitive psychology literature. Design Studies. 29. 160-180. Retrieved August 28, 2021, from https://doi.org/10.1016/j.destud.2008.01.001

Panofsky, E. (1972). *Iconology*. Colorado: Westview.

Schwoer, L. G. (2016). *Gun Culture in Early Modern England*. Charlottesville: University of Virginia Press.

Silva, P. H. D. H. & Wickramasinghe, S. (2007). *Ancient Swords, Daggers and Knives in Sri Lankan Museums.* Colombo: National Museum.